කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන
තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022 (2024)

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2024 ඔක්තෝබර් මස ආරම්භ කොට පේරාදෙණියේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේදී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2024.08.23 වැනි දිනට ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ පළමු ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග පිළිබඳ විස්තරය - ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවේ 08 ඡේදයේ විධිවිධාන අනුව එහි පස්වන පරිශිෂ්ඨයෙහි සඳහන් ආකාරයට විභාගය පිළිබඳ විස්තරය පහත දැක්වේ.

විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කළමනාකරණය | පැය 03 | 100 | 40 |

03. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කළමනාකරණය | 01 කළමනාකරණ මූලධර්ම<br>02 කළමනාකරණ ශ්‍රිතයන්<br>03 කළමනාකරණ පරිසරය<br>04 සහභාගිත්ව කළමනාකරණය<br>05 මහජන සම්බන්ධතා<br>06 යහ පාලනය<br>07 ආචාර ධර්ම |

සාමාර්ථ්‍යය සඳහා ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුය.

04. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පේරාදෙණිය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

05. ඉල්ලුම් පත්‍ර අමුණා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතුය. ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවටද ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස සකස් කළ යුතු වේ. ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුවේ.

06. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය.

07. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව විභාගය පවත්වනු ලබන බලධාරියා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වන බැවින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියළුම නීති රීති මෙම විභාගය සඳහා ද ක්‍රියාත්මක වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

08. ඉල්ලුම් පත්‍ර 2024 අගෝස්තු 23 වැනි දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 13,
ගැටඹේ,
පේරාදෙණිය.

09. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් සඳහා කිසිදු විභාග ගාස්තුවක් අය නොකෙරේ. එතකුදු වුව ද දෙවන වර පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ගාස්තු ලෙස රු.600/= ක් ගෙවිය යුතුයි. එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 - 99 - 00 ආදායම් ශීර්ෂයට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයකින් ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළග තබා ගැනීමද ප්‍රයෝජනවත් විය හැක. කිසිඳු හේතුවක් නිසා මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

10. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එම දිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට අයදුම්කරුගේ නම හා ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ෆැක්ස් අංකය හෝ ඊ මේල් ලිපිනය සඳහන් කර ඒ පිළිබඳව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත වහාම දන්වා සිටිය යුතුය. එහිදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළග තබාගත් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ පිටපත හා විභාග ගාස්තු ගෙවීම අදාළ නම් එම ලදුපතෙහි පිටපත සහ ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම වඩාත් එලදායි වනු ඇත.

11. ඉහත 09 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සළකා බලනු නොලැබේ.

12. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ පමණකි. ඉල්ලුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

13. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

14. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇත්නම් එවැනි විටකදී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

ආචාර්ය. කේ. ඒ. සී. එච්. ඒ. කොතලාවල,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2024 ජූලි මස 17 වැනි දින.